**දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - 2016**

**-----------------------------------------------------------**

දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව, නෝඩික් සංවර්ධන අරමුදල් ණය හා චීන අපනයන හා ආනයන බැංකුව අතර අංක 1711 ශ්‍රී(එස්එෆ්), අංක 2413 - ශ්‍රී, අංක එස්එල් - පී - 70, අංක එස් - එල් - පී - 92, එන්ඩීඑෆ් 324, අංක බීඑල්ඒ 201011 සහ අංක බීඑල්ඒ 201012 දරන ණය ගිවිසුම් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2** <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය</u>

දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, කර්මාන්ත, සංචාරක, ධීවර හා කෘෂිකාර්මික යන අංශ දිරිගැන්වීම මඟින් දකුණු පළාතේ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සහය වීමයි. ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රවේශ පාලක අධිවේගී මාර්ගය ලෙස කිලෝමීටර් 126 ක දුර ප්‍රමාණයකින් බස්නාහිර පළාතේ කොට්ටාව සිට ගාල්ල නගරයට පිවිසෙන පිවිසුම් මාර්ගයත් සමඟ දකුණු පළාතේ මාතර දක්වාත් ඉදිවීම මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵලය විය. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ.ඩො.මිලියන 661.14 කි. දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා අරමුදල් සපයා ඇති ආකාරය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| <u>ණය ලබාදෙන නියෝජිතායතනය</u> | <u>එකඟවූ මුදල</u><br><u>එ.ජ.ඩො. මිලියන</u> | <u>ප්‍රතිශතය</u><br><u>%</u> |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | 186.00 | 28.13 |
| ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහාවූ ජපන් බැංකුව | 103.00 | 15.58 |
| නෝඩික් සංවර්ධන බැංකුව | 5.40 | 0.82 |
| ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සංගමය | 0.80 | 0.12 |
| චීන අපනයන හා ආනයන බැංකුව | 138.21 | 20.90 |
| ශ්‍රී ලංකා රජය | 227.73 | 34.45 |
| එකතුව | 661.14 | 100.00 |

දක්ෂිණ අධිවේගී මාර්ගයේ බස්නාහිර පළාතේ කොට්ටාව සිට දකුණු පළාතේ පින්නදූව දක්වා කිලෝමීටර් 95.05 ක් වූ කොටස 2011නොවැම්බර් 27 දින පොදු මහ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා විවෘත කරන ලද අතර සහ දක්ෂිණ අධිවේගී මාර්ගයේ දකුණු පළාතේ පින්නදූව සිට ගොඩගම දක්වා වූ කිලෝමීටර් 30 ක අනෙක් කොටස 2014 මාර්තු 16 දින පොදු මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා විවෘත කරන ලදී. ඉදිකිරීම් වැඩ නිමකිරීමෙන් පසු, ණය මුදලෙන් ඉතිරිවන රු.බිලියන 4.4 ක් දක්ෂිණ අධිවේගී මාර්ගයට සෘජුවම හෝ වක්‍රව සම්බන්ධ වන ජාතික හා ප්‍රාදේශීය මාර්ග 14 ක් හා පාලම් 2 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා උපයෝජනය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය තීරණය කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2016 දෙසැම්බර් 31 වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂිතව තිබුණි.

**1.3** <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ තත්ත්වයන් යටතේ ගිණුම්

ප්‍රතිපත්ති සහ ගිණුම්කරණ ඇස්තමේන්තු තෝරාගැනීම සහ අනුගමනය කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙනයාම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

**(අ)** අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

**(ආ)** ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

**(ඇ)** ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්,මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

**(ඈ)** ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

**(ඉ)** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

**(ඊ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

**(උ)** මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

**(ඌ)** ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කරන ලද විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2.1 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව හා මෙම වාර්තාවේ 2.2.1 ඡේදයෙහි සඳහන් කරුණුවලින් උද්ගත වන ගැලපීම්වල ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

**(අ)** 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

**(ආ)** සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව හා

**(ඇ)** ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්‍ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

2014 මාර්තු 16 දින අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් වැඩ නිමවීම සහ අදාල ණය කාලපරිච්ඡේද අවසන්වීම වැනි කරුණු සැලකිල්ලට නොගෙන 2015 දෙසැම්බර් 31 දින දක්වා ණය ලබාදුන් නියෝජිතායතන 03 සමඟ වෙන වෙනම එළඹී ණය ගිවිසුම් යටතේ පිළියෙල කළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමඟ සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනද ඉදිරිපත් කර තිබුණි. තවදුරටත් 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනයට දේපල, උපකරණ සහ මෝටර් රථ පැවරීමේ ක්‍රියාවලිය අවසන් කර තිබුණද ගිණුම් අවසන් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

#### 2.2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

කොන්ත්‍රාත් ගිවිසුමේ 3.1 සහ 3.2 වගන්ති මඟින් නියම කරනු ලැබ ඇති ස්වාධීන උපදේශකයෙකු පත්කිරීමට කටයුතු කිරීම වෙනුවට කොක්මාදූව අන්තර්හුවමාරුවේ පුනරුත්ථාපන කොන්ත්‍රාත් වැඩ කටයුතු සඳහා ව්‍යාපෘතියේ උපදේශක ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරයෙකු බඳවාගෙන තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මුල්‍යනය කිරීමට එකඟවූ මුදල | | 2016 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම | 2016 වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | 2016 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | 186.00 | 21,392 | - | - | 20,581 |
| ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව | 329.00 | 43,766 | - | - | 43,635 |
| නෝඩික් සංවර්ධන බැංකුව | 5.40 | 621 | - | - | 583 |
| ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සංගමය | 0.80 | 92 | - | - | 75 |
| චීන අපනයන හා ආනයන බැංකුව | 138.21 | 15,895 | 2,041 | 2,040 | 16,965 |
| ශ්‍රී ලංකා රජය | 227.73 | 26,107 | 352 | 336 | 37,952 |
| එකතුව | 887.14 | 107,873 | 2,393 | 2,376 | 119,791 |

ඉහත දක්වා ඇති පරිදි අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් වැඩ අවසන්වීමෙන් පසුව වුවත් ඉතිරි රු.බිලියන 4.40 ණය වටිනාකම උපයෝජනය කරමින් 2016 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සිදුවී තිබුණි. එපමණක් නොව 2016 ජූනි 30 දිනට ණය ගිවිසුම අවසන්වී තිබුණත් වියදම නොවූ ලෙස පැවති රු.මිලියන 1,570 ක මුදලක් පින්නදූව සිට ගොඩගම දක්වා සිදුකරන ලද අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතුවල නිරතවූ කොන්ත්‍රාත්කරුගේ බැංකු ගිණුමට යවා ඇත. ණය මුදලේ ඉතිරිය බැංකු ගිණුම වෙත මාරු කිරීමේදී, ණය මුදලෙහි ශේෂය භාවිතා කිරීම සඳහා නිසි ක්‍රියාකාරී සැලැස්මක් නොතිබූ බව නිරීක්ෂණය විය.

**3.2 භෞතික කාර්යසාධනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ඉහත සඳහන් කළ පරිදි, ඉතිරිවූ රු.බිලියන 4.4 උපයෝජනය කිරීම සඳහා කිලෝමීටර් 46.70 ක් වූ ජාතික මාර්ග 06 ක් සහ කිලෝමීටර් 56.50 ක් වූ ප්‍රාදේශීය මාර්ග 14 ක් සහ දකුණු පළාතේ පාලම් 02 ක් පුළුල් කර පුනරුත්ථාපනය කිරීම සහ අධිවේගී මාර්ගයේ දකුණු කොටසේ කොක්මාදූවේ නායයෑමෙහි පුනරුත්ථාපන වැඩ කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය තීරණය කර තිබුණි. අධිවේගී මාර්ගයේ පින්නදූව සිට ගොඩගම දක්වා ඉදිකිරීමට කටයුතු කළ කොන්ත්‍රාත්කරු සමඟ අවබෝධතා ගිවිසුමක් 2014 ජනවාරි 28 වන දින අත්සන් කර තිබුණි. ප්‍රගති වාර්තාවට අනුව, ජාතික හා පළාත් මාර්ග 07 ක කිලෝමීටර් 23.2 ක පුනරුත්ථාපන කටයුතු 2016 දෙසැම්බර් 31 වැනි දින අවසන් කර ඇත. කෙසේවෙතත්, කොක්මාදූව බෑවුමේ බිඳවැටීමේ පුනරුත්ථාපන කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

**(ආ)** 2017 ඔක්තෝබර් 11 දින සිදුකරන ලද භෞතික පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි, වැඩ විෂය පථයට ඇතුළත් නොවූ මාතර නගරයේ පෞද්ගලික නිවාසවලට පැවති මාර්ගයක මීටර් 220 ක පුනරුත්ථාපන කටයුතු රු.මිලියන 01 ක පිරිවැයකින් නිමකර තිබුණු අතර තවදුරටත්, භෞතික පරීක්ෂණයට අනුව මාතර අබේගුණවර්ධන මාවත පුනරුත්ථාපනය කළ මාර්ගය දැඩි ලෙස ඉරිතැලී තිබුණු අතර අවශ්‍ය වන ප්‍රතිසංස්කරණ කටයුතු 2016 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් නොකර ඇති බව නිරීක්ෂණය විය.

තවද, ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 294 ක් වූ ගොඩගම තෙලිජ්ජවිල මාර්ගය ඔස්සේ කිලෝමීටර් 11 ක දුර ප්‍රමාණයක් වූ ජලාප්‍රවාහන පද්ධතිය නිම කර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමේ 13.1 වගන්තිය යටතේ වෙන් කරන ලද විධිවිධානවලට පටහැනිව අධිවේගී මාර්ගයේ පින්නදූව සිට ගොඩගම ඉදිකිරීම් කටයුතුවල වගකිව යුතු කාලසීමාව අවසන්වී තිබුණද රු. මිලියන 5,324 පිරිවැයවූ විචලතා නියෝග සඳහා සමාලෝචිත වර්ෂයේදී අනුමත කර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කොන්ත්‍රාත්තුවේ මූලික ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 5,017 ක මුදල සියයට 106 කින් ඉක්මවා ගොස් තිබුණි.

(ආ) අධිවේගී මාර්ගයේ දකුණු කොටසෙහි කොක්මාදුවේ නායයෑමේ ආරක්ෂණයට හා පුනරුත්ථාපන වැඩ කිරීම සඳහා රු.මිලියන 260 ක් වූ පිරිවැයක වූ කොන්ත්‍රාත්තුව මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබානොගෙන උපකොන්ත්‍රාත්කරුවෙකු මඟින් සිදුකරන ලද බව නිරීක්ෂණය විය.තවද, 2016 සැප්තැම්බර් 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණු වැඩ කටයුතු 2017 දෙසැම්බර් 31 වැනි දිනට පවා අවසන් කර නොමැති අතර, තවත් අතිරේක ගෙවීම් රු.මිලියන 19 ක අතිරේක වැඩ කටයුතු කර තිබුණි.

## 3.4 ආර්ථික නොවන ගනුදෙනු

කොන්ත්‍රාත් ලේඛනවල සාමාන්‍ය කොන්දේසිවල උපවගන්ති 4.2 ට අනුව, කාර්යසාධන බැඳුම්කරවල පිරිවැය කොන්ත්‍රාත්කරුවන් ඔවුන්ගේම පිරිවැයෙන් ලබාගත යුතුය. කෙසේවුවත්, කාර්යසාධන බැඳුම්කර සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විසින් වැය කරන ලද රු.මිලියන 19.20 ක මුදල ව්‍යාපෘතිය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

## 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිවේගී මාර්ගයේ කළමනාකරණ ඒකකයට භාවිතා කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 31.20 ක වියදමින් මෝටර් වාහන 04 ක්, ණය ආධාර වලින් කොන්ත්‍රාත්කරුට ගෙවන ලද මුදලින් ලබාදී තිබුණු බව නිරීක්ෂණයවූ අතර එය ඇස්තමේන්තුගත වියදමට වඩා රු.මිලියන 20 කින් ඉක්මවා තිබුණි. කෙසේවෙතත්, බලයලත් පාර්ශවයන්ගේ අවශ්‍ය අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියට අධීක්ෂණය හා අධීක්ෂණ කටයුතු පැවරීමකින් තොරව මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වසා දැමීමෙන් පසුවද ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය 2016 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක වූ බව නිරීක්ෂණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අදාල පිරිවැය සපුරාලීම සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 35 ක මුදලක් මෙම ව්‍යාපෘතිය මඟින් වැය කර තිබුණි.

## 3.6 ඵල රහිත ගනුදෙනු

ව්‍යාපෘතිය මඟින් අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම් ප්‍රමාදවීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියට පොළිය ලෙස රු.මිලියන 384.80 ක් දැරීමට සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය. තවද, අත්පත් කරගත් ඉඩම් පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.